# ECHO OF HIS CALL

# කැඳවීමේ ප්‍රතිරාවය

SINHALA

ECHO OF HIS CALL 1969-2019 GOLDEN JUBILEE (ECHO GROUP)

India's National Spiritual Newspaper

₹ 10/-

Published monthly in ENGLISH, TAMIL, MALAYALAM, TELUGU, HINDI, KANNADA, MARATHI, BENGALI, GUJARATI, ODIYA, ASSAMESE, PUNJABI, NEPALI, URDU, SINHALA & AFRIKAANS

Editor : S. SAM SELVA RAJ

16 Languages

Vol. XV — YEAR OF OUR LORD JESUS CHRIST, JUNE 2021 — Issue No. 8


## ශුද්ධවූ බයිබලය

**ශුද්ධවූ බයිබලය**

**(ගීතාවලිය 91:1-10)**

1. මහෝත්තමයාණන්ගේ රහස් ස්ථානයෙහි වසන තැනැත්තේ සර්වපරාක්‍රමයාණන්ගේ සෙවනෙහි වාසයකරන්නේය.
2. උන්වහන්සේ මගේ රක්ෂාස්ථානයය. මාගේ බලකොටුවය. මා විසින් විශ්වාස කරන මාගේ දෙවියන්වහන්සේයයි ස්වාමීන් ගැන කියන්නෙමි.
3. මක්නිසාද උන්වහන්සේ පක්ෂි වැද්දාගේ මලපතින්ද, විනාශ කරන වසංගතයෙන්ද නුඹ මුදා හරිනසේක.
4. උන්වහන්සේ ස්වකීය පියාපතින් නුඹ වසනසේක. නුඹ උන්වහන්සේගේ පියාපත් යට ආරක්ෂාවන්නෙහිය. උන්වහන්සෙගේ සත්‍යවාදීකම පලිහක්ය. මහා පලිහක්ය.
5. රාත්‍රියේ භීතියටවත්, දවාලේ විදින ඊගසටවත්,
6. අඳුරේ යනවසංගතයටවත්, ඉරමුදුන් වේලේ පාළුකරන විනාශයටවත් නුඹ භය නොවන්නෙහිය.
7. නුඹේ පැත්තක දහසක්ද දකුණු පැත්තෙහි දසදහසක්ද වැටෙන්නෝය. එහෙත් එය නුඹට ළං නොවන්නේය.
8. නුඹේ ඇස් වලින් බලා, දුෂ්ටයාගේ විපාකය දකිනවා පමණක්ය.
9. මක්නිසාද ස්වාමීනි, ඔබ මාගේ රක්ෂස්ස්ථානයය. නුඹ මහෝත්තමයාණන් නුඹේ වාසස්ථානය කරගත්තෙහිය.
10. නුඹට කිසි නපුරක් නොපැමිණෙන්නේය. නුඹේ කූඩාරමට වසංගතයක් ළං නොවන්නේය.

# දෙවියන්වහන්සේගේ

# සම්පූර්ණත්වයෙන් පිරී සිටින්න!

## Be filled with the Fullness of GOD!

(Message delivered by Pastor S. Sam Selva Raj in the Main Church)

*''ක්‍රිස්තුස්වහන්සේගේ දැන ගත නොහැකි ප්‍රේමය දැනගෙන, එහි පළල, දිග, දිග, උස ගැඹුර කිමෙක්ද කියා තේරුම් ගන්ට නුඹලාට පුළුවන් වන පිණිසත්''(එපීස 3:18-19)*

*''උන්වහන්සේගේ ආත්මයාණන්වහන්සේ කරණකොටගෙන නුඹලාගේ අභ්‍යන්තර මනුෂ්‍යයා තුළ නුඹලා බලයෙන් ශක්තිමත් වන පිණිසත්, ඇදහිල්ල කරණකොටගෙන ක්‍රිස්තුස්වහන්සේ නුඹලාගේ සිත් තුල වාසය කරන පිණිසත්, නුඹලා ප්‍රේමයෙහි මුල් ඇද පිහිටා සිට, දෙවියන්වහන්සේගේ මුළු පූර්ණකමට පූර්ණ වන පිණිස සියලු ශුද්ධවන්තයන් සමග ක්‍රිස්තුස්වහන්සේගේ දැනගත නොහැකි ප්‍රේමය දැනගෙන එහි දිග, පළල, උස, ගැඹුර කිමෙක්ද කියා තේරුම් ගන්ට නුඹලාට පුළුවන්වෙන පිණිසත්, උන්වහන්සේගේ මහිමයේ සම්පතේ හැටියට නුඹලාට දෙන මෙන් යාච්ඤා කරමි.*
*(එපීස 3:16-19)*

*''තවද අපි තවත් මනුෂ්‍යයන්ගේ වංචාවෙන්ද ප්‍රයෝගයෙන්ද රැවටිලි සහිත උපමාරුවෙන්ද හටගන්නා සියළු ආකාර ඉගැන්වීම් නමැති සුළඟින් ඈත මෑත විසිවෙමින් ගෙනයනු ලබන්නා වූ බාලයන් නොව පිණිසත්, ප්‍රේමයෙන් යුක්තව ඇත්ත කතා කරමින්, හිසව සිටින ක්‍රිස්තුස්වහන්සේ උදෙසා සියලු දේවලදී වැඩෙන පිණිසත්..''*
*(එපීස 4:14-15)*

### කිතුනු ජීවිතයේ පළමු පියවර

යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තම එකම ගැලවුම්කරුවාණන් ලෙස පිළිගෙන, බෞතීස්ම ලබා දේවස්ථානයට පැමිණීම යන මේ සෑම දෙකේම කිතුණු ජීවිතයේ පළමු පියවර ලෙස සැලකිය හැක. බොහෝ දෙනෙක් මේ පළමු පියවරෙන් ජීවිතය නවතා ගනී. තමා කිතුණුවන් ලෙස පෙන්වා ගැනීමට බොහෝ බාහිර කරුණු වලට මුල් තැන දී ක්‍රියා කරති. පළමු පියවරට අදාල කාරණා නවතා දමා මෙවැනි කිතුණු ජීවිතයක් ගත කිරීම ඉතා අනතුරුදායක වෙයි. එය කොයි මොහොතක හෝ අපගේ ජීවිතයට හානියක් ඇති කරනු ඇත. එනිසා කිතුනු ජීවිතයේ දෙවන පියවරට යාම ඉතාම වැදගත් වෙයි. අප

3 වෙනි පිටුවට ...

# ECHO OF HIS CALL - (1969-2019 GOLDEN JUBILEE YEAR)

## from your dearly beloved brother...



*"ඔබගේ ගෘහය වූ ඔබගේ ශුද්ධ මන්දිරයේ යහපතින් අපි තෘප්තියට පැමිණෙන්නෙමුව" (ගීතාවලිය 65:4)*



**OUR MISSION POLICY**
We should expound and teach the contemporary generation the undiluted teachings of the ancient and early Apostles. It is the need of the hour.


**CHIEF EDITORS**
Pastor S. Sam Selva Raj
Angeline Selvakumari Henry, M.A., M.Ed.

**MANAGING EDITOR**
Pastor Alex Samson Sam, B.Th., M.Div.

**EDITORIAL BOARD**
Sis. Jesy Veena Sam
Bro. M. Paul Raj, M.A., B.Ed.
Sis. Serena Bevin, M.A., M.Phil., B.Ed.

**CORE ADVISORS**
Aud. K. Puratchivendan, M.Com., B.L.
Er. C.G.S. Babu Rao, B.Tech., M.Tech (DM)
Dr. S. Rabinder Boaz, M.S.
Dr. J.R. Jeyabalan
Adv. N. Balaji, B.Com., B.L.
Sis. Ajitha Mary, M.A.



**PUBLISHER, PRINTER & PROPRIETOR**
Pastor S. SAM SELVA RAJ
Echo of His Call Printers
10, Mohammed Abdullah 2nd Street,
Chepauk, Chennai- 600 005, India.
Phone : (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766
Cell : (+91) 98410 71852, 95661 31858

**E.Mail ID**
sam@echoofhiscall.org
biblecor@yahoo.co.in

**WEBSITES**
www.echoofhiscall.org /
www.echoofhiscall.com


**ස්වාමින්වහන්සේ තුළ ප්‍රේමණීය සහෝදරයා□ සහෝදරියා□**

**මා සහ මගේ පවුලේ අය සමග අත්වැල් බැඳ ගත්තා වූ ඔබ සියළු දෙනාටම යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළින් ආසිරි පතමි**

ඔව්, දෙවියන්වහන්සේ යහපත්ය. සෑම අන්දමකින්ම උන්වහන්සේ මගේ ජීවිතයට යහපත්ය. උන්වහන්සේ සෑමවිටම මාව පෝෂණය කරමින් මාගේ අවශ්‍යතා සපයමින් දුර්වලකම් වලදී මාව ශක්තිමත් කරමින් මට මගපෙන්වන සේක. පසුගිය මාසයේදී මා සහ මගේ පවුලේ අය කොවිඩ් 19 රෝගයට ගොදුරු වී සිටියදී උන්වහන්සේ අප සමග සිටිමින් අපට සුවය ලබා දුන් සේක. ඒ කාලයේදී අප උදෙසා යාච්ඤා කළා වූ අපගේ සියළු සහෝදර සහෝදරියන්ට අපගේ ස්තුතිය පුද කරමි.

එසේම එම කාලවකවානුව තුළදී කැඳවීමේ ප්‍රතිරාවය සඟරාවේ වැඩකටයුතු කිසිඳු බාධාවකින් තොරව ඉදිරියට කරගෙන යාමට උදව් උපකාර කළා වූ සියළුම දෙනාටම මාගේ හෘදයාන්ගයෙන්ම ස්තුති පුද කරමි. එසේම අපට ආර්ථික ලෙස බොහෝ අවශ්‍යතාවයන් ඇති අතර නොයෙකුත් ද්‍රව්‍යයන් ලබා ගැනීමටත්, වේතන ගෙවීමටත් අවශ්‍යව ඇත. අප සාමාන්‍යයෙන් ඔබගෙන් යමක් නොඉල්ලන අතර සැබැවින්ම ඔබ අපට ප්‍රේම කරනවා නම් අප උදෙසා ප්‍රේමයේ දීමනාවක් එවන මෙන් ඉතා ආදරයෙන් ඉල්ලා සිටිමි. ඒ සඳහා මුදල් ඇනවුමකින්, චෙක්පත් වලින් NEFT වලින් ගෙවීම් කළ හැකිය. (සෑම් සෙල්වරාජ් sam@echoofhiscall.org) දුරකථන (9841071858) Gpay (9841071858) වෙස්ටන් යුනියන්, මනි ඕඩර් හෝ ඔබ කැමති ඕනෑම ආකාරයකට අපගේ මෙම සේවයට උපකාර කරන මෙන් ඉතා කරුණාවෙන් ඉල්ලා සිටිමි. ඔබ එසේ උපකාරයක් කළ පසු කෙටි පණිවිඩයකින් හෝ දුරකථන ඇමතුමක් තුළින් අපට දන්වන මෙන් ඉතා කරුණාවෙන් ඉල්ලා සිටිමි. එසේ කරන්නාවූ ඔබට අපගේ හෘදයාන්ගයෙන්ම ස්තුතිය පුද කරමි. දෙවියන්වහන්සේ ඔබට ආශිර්වාද කරන සේක්වා. මේ වන විට ඉන්දීය රජය විසින් අපගේ පිටරට ගිණුම් වසා ඇති අතර නැවත අලුත් ගිණුම් ආරම්භ කරන තෙක් පහත සඳහන් ගිණුම් අංක වලට මුදල් බැර කරන මෙන් ඉල්ලා සිටිමි.

**SAM SELVA RAJ**
STATE BANK OF INDIA, Triplicane Branch, Chennai.
Account No : 102329 34679
IFSC Code : SBIN 0000 249 SWIFT Code : SBI NIN BB 455

අප ඔබට බොහෝ ප්‍රේම කරමි. ඔබ අප හා සමග අත්වැල් බැඳගෙන මේ සේවය සමග සිටින නිසා අපි සතුටු වෙමු. *"ස්වාමින්වහන්සේ කෙරෙහි විශ්වාසකොට, ස්වාමින්වහන්සේ තමාගේ විශ්වාසය කොට තබාගෙන සිටින මනුෂ්‍යයා වාසනාවන්තයෙක්ය. මක්නිසාද ඔහු ජලය ළඟ හිටවා තිබෙන්නාවු ගඟ ළඟ මුල් අදින්නාවූ, ග්‍රීස්මය පැමිණෙන විට එය නොදැනෙන්නාවූ, කොළ නොවේලන්නාවූ, නියං අවුරුද්දේදී නොමැලෙන්නාවූ, ඵල දැරීමෙන් තොර නොවෙන්නාවූ ගහකට සමාන වන්නේය..." (යෙරමියා 17:7-8)*

ලෝකය පුරා බොහෝ රටවල් වලට ඉතා සීඝ්‍රයෙන් ව්‍යාප්ත වෙන්නාවූ මෙම කොවිඩ් වසංගතයට ඇති එකම විසඳුම වන්නේ යාච්ඤාව පමණි. ස්වාමින්වහන්සේගේ පියාපත් යට අපව ආරක්ෂා කරන පිණිස අප නොකඩවාම යාච්ඤා කරමු. *"මක්නිසාද උන්වහන්සේ පක්ෂි වැද්දාගේ මලපතින්ද විනාශකරන වසංගතයෙන්ද නුඹ මුදාහරින සේක." (ගීතාවලිය 91:3)* දෙවියන්වහන්සේ ඔබට ආශිර්වාද කරන සේක්වා.


**යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුල ඔබගේ සේවක**
**පාස්ටර් සෑම් සෙල්වරාජ් සහ ඇලෙක්ස් සෑම්සන් සෑම්**
(+91) 98412 71858 / 98410 71858
**Email :samselvaraj333@gmail.com**



**Our Ministries:** ECHO OF HIS CALL Monthly Magazines (16 languages) BIBLECOR - Postal Courses (3 languages) Theological Correspondence Courses (2 languages) Church Planting Nehemiah Bible Colleges Gospel Printing Press Great Commission Partners St. Paul's Matriculation School Crusades Community Development

*1 පිටුවෙන්....*

හැමදාම ආත්මික ළදරුවන් ලෙස නොසිට වර්ධනය විය යුතු බව බයිබලය ඉතා පැහැදිලි ලෙස සඳහන් කරයි. (එපීස 4: 14-15)

එබැවින් අප දිනපතා වර්ධනය විය යුතුමය. එලෙස වර්ධනය නොවන්නේ නම් ජීවිතයේ සෑම දෙයක්ම අඩාල වෙනු ඇත. දෙවියන්වහන්සේ අපව කැඳවා ඇත්තේ මහත් වූ අරමුණක් ඇතිවය.

දෙවියන්වහන්සේ විසින් රූප වන්දනා කරන්නන් අතරින් ආබ්‍රහම්ව කැඳවනු ලැබුවේ රාජ්‍යයන්ට ආශිර්වාද කරන පිණිසය. එබැවින් දෙවියන්වහන්සේ ඔබවත් මාවත් කැඳවා ඇත්තේ මහත් වූ පිබිදීමක් ඇති කරන පිණිසය. දෙවියන්වහන්සේ උදෙසා යහපත් ජීවිතයක් ගත කරන පිණිස හා උන්වහන්සේගේ අරමුණු ඉටු කරනු පිණිස පළමු පියවරේ සිට ඊළඟ පියවරට අපගේ ජීවිත කැප කළ යුතුය.

## කිතුණු ජීවිතයේ දෙවන පියවර

දෙවන පියවරේදී අපි උන්වහන්සේව අපගේ හිස ලෙස පිළිගෙන උන්වහන්සේ තුළ මුල් ඇද වර්ධනය වී ඇදහිල්ලෙන් බලවත් වෙමු. අප ලබාගත්තාවූ ඥානය, අත්දැකීම් හා දර්ශන තුළින් දිනපතාම වර්ධනය විය යුතුය. අප දිනපතාම වර්ධනය වන්නාවූ දරුවන් මෙන් සිටිය යුතුය කියා දේව වචනය ඉතා පැහැදිලි ලෙස පෙන්නුම් කර ඇත. මා ඔබ සමග බෙදාගන්නාවූ දේව පණිවිඩය තුළින් ඔබගේ ආත්මික ජීවිතය තුළ මහත් වූ දේ කරනු පිණිස දෙවියන්වහන්සේ යම් කාරණයක් එළිදරව් කරයි.

### 1. උන්වහන්සේ තුළ මුල් ඇදීම

කිතුණු ජීවිතය පිටස්තරව අලංකාරව පෙනෙන්නාවූ ජීවිතයක් නොව එය ඇතුළාන්තය තුළින් අලංකාර විය යුතුව ඇත. ගසක් වර්ධනය වන්නාක් මෙන් කිතුණු ජීවිතය දිනෙන් දිනම වර්ධනය විය යුතුය. අප ගසක් පැළ කල විටදී එය නිසි ලෙස වර්ධනය වීම සඳහා පස තුළින් ජලය හා පෝෂ්‍ය සංඝටක උරාගන්නා අතර වාතය හිරු එළියද ලබා ගනියි. ඒ ආකාරයට කිතුණුවන් ද යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළ මුල් ඇද වර්ධනය විය යුතුය. එලෙස ඔබ යේසුස්වහන්සේ තුළ ස්ථිරව මුල් ඇද ශක්තිමත් වූ විට මේ ලෝකයාගෙන් ඔබට එරෙහිව එන්නාවූ ඕනෑම අභියෝගයක් ජය ගැනීමට උන්වහන්සේගේ බලය ඔබට ලැබෙන්නේය. ගසකට අවශ්‍ය සියළු පෝෂ පදාර්ථ ලබාගැනීමටනම් ගැඹුරටම එහි මුල් ඇදිය යුතුය. එසේම අපත් දෙවියන්වහන්සේගේ දැනගැන්ම තුළින් ආත්මිකව ගැඹුරටම යාම අත්‍යාවශය වේ. සියලුම අතු කඳට හොඳින් සම්බන්ධ වුවහොත් හොඳ ඵල දැරීමට හැකිය.

අප දෙවියන්වහන්සෙත් සමග කොයිතරම් දුරට කාලය ගත කරනවාද එතරම් දුරට උන්වහන්සේ තුළ ඉතා ගැඹුරටම මුල් අදිනු ඇත. කොයි තරම් දුරට අප දේව වචනයට ප්‍රේම කරමින් එය කියවා එය තුළ ජීවත් වීම කරනකොට ගෙන් යේසුස් වහන්සේ තුළ මුල් ඇදීමට හැකි වෙයි. අප දිනපතාම දේව වචනයට ප්‍රේම කරමින් එය වැළඳ ගත යුතුය. අප මුදල් ඉතා ආරක්ෂිත ස්ථානවල තබනවාක් මෙන් දේව වචනයට ද වැදගත් තැනක් දිය යුතුව ඇත. දෙවියන්වහන්සේ තුළින් මුල් අදිනු ලැබූ කිතුණුවන් කොටස් දෙකකට බෙදිය හැක.

1. දෙවියන්වහන්සේ උදෙසා ඔවුන්ගේ ජීවිතය කැල කල අය
2. දෙවියන්වහන්සේ උදෙසා ඔවුනගේ ස්ව කැමැත්ත අත්හැරියා වූ අය

දෙවියන්වහන්සේ උදෙසා තම ජීවිතය කැල කරමින් ඔවුන්ගේ ආශාවන හා අනාගතය උන්වහන්සේට බාර දෙන්නේ නම් ඔවුන් ස්ථිර ලෙසම දෙවියන්වහන්සේ තුළ මුල් ඇද ගත්තාවූ සෙනඟයි. කොතරම් දුරට ඔබ මුල් ඇද තිබේ ද එතරම් දුරට ඔබ ඔබගේ ජීවිතය උන්වහන්සේට කැප කරමින් උන්වහන්සේ මත රඳා පැවතෙමින් උන්වහන්සේගේ මඟ පෙන්වීම ලබා ගන්නවා ඇත. ගසක් ස්ථිර තැනක පමණක් තිබෙනවානම් ඒ ගස ගැඹුරට මුල් අදිමින් පස තුළින් ගසට අවශ්‍ය පෝෂ්‍ය පදාර්ථ නිසි ලෙස ලබාගෙන වර්ධනය වෙයි. නමුත් අප ගසක් විටින් විට ගලවමින් එක් එක් ස්ථානවල හිටවන්නේ නම් ඒ ගසට හානි සිදුවෙයි. ඒ ආකාරයට අපගේ ජීවිතයට දෙවියන්වහන්සේ ස්ථිරව දී තිබෙන්නාවූ තලෙන්තයන් නිසි ලෙස වර්ධනය වීමට නම් දෙවියන්වහන්සේව පමණක්ම ඉතා තදින් අල්ලාගෙන සිටිය යුතුය.

***''එබැවින් සහෝදරයෙනි, නුඹලාගේ ශරීරයන් ජීවමාන වූ, ශුද්ධ වූ, දෙවියන්වහන්සේ විසින් පිළිගත හැකි වූ යාගයක් කොට ඔප්පුකරන හැටියට දෙවියන්වහන්සේගේ දයාවන් නිසා නුඹලාගෙන් ඉල්ලමි. එය නුඹලාගේ ආත්මික සේවය වේ. නුඹලා මේ ලෝකයේ ආකාරයට සමාන නොවී දෙවියන්වහන්සේගේ කැමැත්ත, එනම් යහපත් වූ, පිළිගත යුතු වූ, සම්පූර්ණ වූ දෙය කිමෙක්ද කියා දැනගන්නා පිණිස, සිත අළුත්කර ගැනීමෙන් අන්‍යාකාර ඇත්තෝ වෙයල්ලා.'' (රෝම 12:1-2)***

අප අන් අයව අනුකරණය නොකළ යුතු අතර අප යේසුස්වහන්සේව පමණක් අනුගමණය කළ යුතුව ඇත. එනම් යේසුස්වහන්සේ තුළ මුල් ඇද්දා වූ ජීවිතයක්

*4 වෙනි පිටුවට....*

මේ ආකාරව තිබේ. එවිට ඔබට ඔබගේ ජීවිතය ඵල දරන්නා වූ හා අන් අයට ආශිර්වාදමත් ජීවිතයක් ගතකළ යුතුය.

වර්ථමාන ලෝකය තුල අපටම කියා ආවේනික වූ ජීවිතයක් තිබේ. උදෑසන අප නැගිට යාච්ඤා කර උදෑසන ආහාරය ගෙන රැකියා සඳහා පිටත්ව යති. පසුව නැවත නිවසට පැමිණ ආහාර ගෙන යාච්ඤා කාලයක් ගත කරමින් නින්දට යති. බයිබලය කියවීමට අපට කාලයක් නැත. එමෙන්ම නමස්කාරයට හා ප්‍රශංසාවට අපට කාලයක් නොමැත. උන්වහන්සේගේ යහපත් ගුණාංග සිහි කිරීමටද අපට කාලයක් නොමැත. අද මනුෂ්‍යයන් ඉරු දින පමණක් ශුද්ධ වූ ජීවිතයක් ගත කරන අතර සතියේ අනෙක් දින වලදී එය අමතක කර දමති. මෙය ඉතා අනතුරුදායක වූ දෙයකි. ඉරු දිනදී පමණක් අප දෙවියන්වහන්සේට නමස්කාර කරමින් උන්වහන්සේගේ ගුණ ගායනා කිරීම උන්වහන්සේ ප්‍රිය නොකරන්නා වූ දෙයක් වෙයි. වර්ථමාන කිතුණුවන් මෙවැනි ජීවිතයක් ගත කිරීමෙන් තෘප්තිමත් වනු ඇත. මෙවැනි ජීවිතයක් පමණක් ගත කිරීම ප්‍රමාණවත් නොවන අතර ඔබ ක්‍රිස්තුස්වහන්සේ තුළ ගැඹුරට මුල් ඇද්දා වූ කිතුණුවෙකු ලෙසින් ජීවත්වීම අනිවාර්‍ය දෙයක් වනු ඇත.

බයිබලයේ පොත් කියවීම ඉතා යහපත් වූ දෙයකි. නමුත් අප වෙනත් පොත් කියවන්නාක් මෙන් එය නොකියවා එය මෙනෙහි කිරීමෙන් යුතුව කියවා එහි ඇති සත්‍යතාවයන් අපගේ ජීවිතයට අදාල කරගත යුතුව ඇත. නමුත් බයිබලය වැඩි දුර අධ්‍යයනය කිරීම සඳහා විවිධ පුද්ගලයන් විසින් රචනා කර ඇති පොත් පමණක් කියවීම සාර්ථක නොවනු ඇත. මන්ද එම පොත්වල ලියා ඇති කරුණු එහි කතෘට පුද්ගලිකව දේව වචනය තුළින් ලැබුණා වූ පණිවිඩයකි. එම නිසා අප බයිබලය කියවා මෙනෙහි කළ යුතුය. අප වෙනත් පොත් පත් කියවීමෙන් අපට බයිබලය ගැන හා බයිබලයේ සමහර කරුණු කාරණා ගැන පමණක් දැන ගැනීමට හැකි වෙයි. එබැවින් අපේ ආත්මික ජීවිතය වර්ධනය වීමට වීමට නම් බයිබලය කියවා එය මෙනෙහි කර එහි සත්‍යතාවය දැනගත යුතුව ඇත.

බොහෝ අය වෙනත් පොත් කියවීමෙන් තෘප්තිමත් වන අතර තවත් සමහරු බයිබල් පද සඳහන් කර ඇති දින දර්ශනවල දවසට අදාල පද කියවා රැකියා යති. තවත් සමහරු බයිබලයෙහි එක් පදයක් කියවා මුළු බයිබලයම කියවූවාය කියා සිතති. ඔබත් එවැනි ජීවිතයක් ගත කරන්නේ නම් අවසාන කාලයේදී ඔබව වංචාවලට ගොදුරු වනු ඇත. ඔබ දේව වචනය තුළ ස්ථිරව නොසිටින්නේනම් ඔබගේ ජීවිතයට බාධා නමැති සුළි සුළං හමන විටදීත් ඔබගේ ජීවිතේ තීරණාත්මක අවස්ථාවන් වලදීත් ඔබ මුලාවට ලක්වෙනු ඇත. ඔබ දෙවියන්වහන්සේ තුළ ගැඹුරුව මුල් ඇද නැතිවිටදී ඔබ මංමුලාවෙනු ඇත.

ඔබ උදෑසනින් නැගිට නිහඬ කාලයක් තෝරාගෙන දෙවියන්වහන්සේගේ අභිමුඛත්වය තුළ නිශ්චලව වාඩි වී අඩුම තරමින් බයිබලයේ එක් පරිච්ඡේදයක් කියවා එයින් ඔබගේ ජීවිතයට ලබාගත හැකි දේ මෙනෙහි කරන්න. උදාහරණයක් ලෙස, ''ස්වාමීන්වහන්සේ මාගේ එඬේරාය.''යන වචනය ඔබ කියවනවානම්, එම කොටස ගෙන, ''ඔබ එඬේරා නම් මම බැටළුවෙක්ද?'' කියා ප්‍රශ්ණ කිරීමට හැකිය. ''බැටළුවන් බැටළු එඬේරාට කීකරු වෙනවා නම්, මා උන්වහන්සේට කීකරු වෙනවාද?'' යනුවෙන් ප්‍රශ්ණ නගමින් අප දේව වචනය මෙනෙහි කළ යුතුව ඇත.

අද යක්ෂයා වඩ වඩා කිතුණුවන්ගේ ජීවිත වලට ඇතුල් වී ඔවුනට යාච්ඤා කාලයක් ගත කිරීමට හා දෙවියන්වහන්සේට මුල් තැන දී ක්‍රියා නොකරනු පිණිස වංචා සහගතව ක්‍රියාවන් කරමින් සිටී. ඔබ නිතරම දේව වචනය කියවමින් ඔබ දෙවියන්වහන්සේගෙන් ''පියාණනි, මා යා යුතු මාර්ගය කුමක්ද? මා වෙනස් විය යුත්තේ කුමන අංශයන් වලින්ද?'' කියා ඇසුවහොත් උන්වහන්සේ ඔබට පිළිතුරු සපයනවා ඇත. එසේම, ''අපගේ පාපය කුමක්ද? මා ගතයුතු තීරණ කුමක්ද?'' කියා ඇසිය යුතුය. මෙවැනි දේ වලට දෙවියන්වහන්සේ ඔබට ඉතා පැහැදිලිවම පිළිතුරු සපයනවා ඇත. ***''ක්‍රිස්තුවහන්සේට එකඟ නැත්තා වූ මනුෂ්‍යයන්ගේ පරම්පරාගත නියෝග වලත් ලෝකයේ ගුරුකම්වලත් ප්‍රකාරයට තිබෙන පණ්ඩිතකමද හිස් වූ රැවටිලිකාරකමද කරණකොට නුඹලා කොල්ලයක් කරගන්න කිසිවෙක් නොසිටින හැටියට බලාගනිල්ලා.''(කොළොස්සි 2:8)***

අද කාලයේ බොහෝ මනුෂ්‍යයන්ගේ අදහස් දාර්ශනිකයන්ගේ දැනුම කරණකොටගෙන පවතින බැවින් බොහෝ දෙනාගේ ජීවිත නාස්ති වී ඇත. නමුත් ඔබ දිනපතාම බයිබලය නිසි ලෙස කියවා එය මෙනෙහි කරන්නේ නම් දෙවියන්වහන්සේ ඔබට කතා කරනු ඇත. එබැවින් ඔබගේ අනාගතය ගැන දැනගැනීමට ඔබගේ ගැටළුවලට පිළිතුරු සෙවීමට විවිධ ස්ථානවලට යාමට අවශ්‍ය නැත. මන්ද ඔබ දෙවියන්වහ්නසේ තුළ යහපත් සහ ස්ථිර ලෙස ජීවිතයක් ගත කරමින් ඉතා ගැඹුරට මුල් ඇද්දා වූ ජීවිතයක් ගත කරන්න.

### (2) උන්වහන්සේ තුළ ගොඩනැගීම

දේව වචනය තුළ මෙසේ පවසයි. *''උන්වහන්සේ තුල මුල් ඇද ගොඩනැගෙන්න.'' (කොලොස්සි 2:7)*

අප යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුලින් ගොඩනැගිය යුතුව තිබේ.

***''ක්‍රිස්තුස්වහන්සේගේ වචනය නුඹලා තුල සියලු ප්‍රඥාවෙන් සමෘද්ධව වාසය කෙරේවා. නුඹලා***

GREAT COMMISSION PARTNERS
ECHO OF HIS CALL MINISTRIES
SINCE 1969

# යාච්ඤා පංගුකාර සේවයේ අයට යාච්ඤා ඉල්ලීම්

**බෙදා ගැනීම (ගලාති 6:2)**
**උපකාර කිරීම (රෝම 12:13) සහ**
**පුබුදු කිරීම (2 තිමෝති 1:6)**

## ස්තුති දීම හා ප්‍රසංශා කල යුතු කරුණු

**මැයි : 19-** ''කැඳවීමේ ප්‍රතිරාවය'' දේව සේවය ගැන ස්තුති ප්‍රශංසා කරමු.

**මැයි : 20-** කිතුණු දේවස්ථානවල ප්‍රධාන සභාපාලකවරුන් ගැන ස්තුති ප්‍රශංසා කරමු.

**මැයි : 21-** කිතුණු දේවස්ථානවල දේව සේවකයන් හා ඇදහිලිවතුන් ගැන ස්තුති ප්‍රශංසා කරමු.

**මැයි : 22-** භාෂා 17 කින් මුද්‍රනය වන 'කැඳවීමේ ප්‍රතිරාවය' පුවත් පත් සේවය ගැන ස්තුති ප්‍රශංසා කරමු.

**මැයි : 23-** යාච්ඤා මැදහත්කරුවන් හා නිවෙස් තුළ පවත්වන දේව මෙහෙයන් ගැන ස්තුති ප්‍රශංසා කරමු.

**මැයි : 24-** ධර්මදූත සේවයේ යෙදෙන සෑම දේව සේවකයන් ගැන ස්තුති ප්‍රශංසා කරමු.

**මැයි : 25-** ශාඛාසභා රෝපණය කරන සෑම දේවස්ථානයක් ගැනම ස්තුති ප්‍රශංසා කරමු.

**මැයි : 26-** ගැලවීම ලබා කිතුණු දේවස්ථානවලට එකතු වන නවක ඇදහිලිවතුන් ගැන ස්තුති ප්‍රශංසා කරමු.

**මැයි : 27-** ''මක් නිසාද දෙදෙනෙක් තුන් දෙනෙක් මාගේ නාමෙන් යම් තැනක රැස්ව සිටිත්නම් මම එතැන ඔවුන් මැද සිටිමියි කී සේක.(මතෙව් 18:20) බයිබල් පාඨය කියවමින් ස්තුති ප්‍රශංසා කරමු.

**මැයි : 28-** ශුද්ධාත්මයෙන් පූර්ණවීම උදෙසා සෑම ඇදහිලිවන්තයෙකු ගැන ස්තුති ප්‍රශංසා කරමු. ග

**මැයි : 29-** සෑම උපකාර සේවාවන්හි යෙදෙන කිතුණුවන් ගැන ස්තුති ප්‍රශංසා කරමු.

**මැයි : 30-** ''ගෘහ සභා'' සහ ''ගෘහ ශෛල'' සේවය ගැන ස්තුති ප්‍රශංසා කරමු.

**2021 ජූනි මාසය**

**ජූනි : 01-** ''නුඹලාගෙන් කිසිවෙක් පාපයේ රැවටිලිකාරකමින් දැඩි නොවන පිණිස දවස්පතාම එකිනෙකාට ආශිර්වාද කරන්න.''(හෙබ්‍රෙව් 3:13) බයිබල් පාඨය කියවමින් ස්තුති ප්‍රශංසා කරමු.

## යාච්ඤා කිරීම් සඳහා කරුණු

**ජූනි : 02-** සෑම රටකම සේවය කරන මිෂනාරිවරුන් හා ඔවුන්ගේ පවුලේ අය ගැන ස්තුති ප්‍රශංසා කරමු.

**ජූනි : 03-** ''කැඳවීමේ ප්‍රතිරාවය'' නිර්මාතෘ පාලක සෑම් සෙල්වරාජ් ඇතුලු පවුලේ අය ගැන ස්තුති ප්‍රශංසා කරමු.

**ජූනි : 04-** ලෝක සාමය උදෙසා යාච්ඤා කරමු.

**ජූනි : 05-** දේව සේවයේ සෑම ක්‍රියාකාරකම් උදෙසා යාච්ඤා කරමු.

**ජූනි : 06-** ''කැඳවීමේ ප්‍රතිරාවය'' පුවත්පත් සේවය වර්ධනය උදෙසා යාච්ඤා කරමු.

**ජූනි : 07-** සෑම රටකම ජනතාවගේ ආරක්ෂාව හා ජාතීන් අතර එකමුතුව උදෙසා යාච්ඤා කරමු.

**ජූනි : 08-** මනුෂ්‍යයන් නපුරු මාවත් වලින් හැරී දෙවියන්වහන්සේ වෙතට ළංවෙන පිණිස යාච්ඤා කරමු.

**ජූනි : 09-** කොවිඩ් වසංගත තත්ත්වය නිසා රැකියා අහිමි වූ අය උදෙසා යාච්ඤා කරමු.

**ජූනි : 10-** කොවිඩ් වසංගත තත්ත්වය නිසා බයිබල් විද්‍යාලවල ඉගෙනුම් අවස්ථා අහිමි වුන ශිෂ්‍ය ශිෂ්‍යාවන් ගැන යාච්ඤා කරමු.

**ජූනි : 11-** කොවිඩ් වසංගත තත්ත්වය නිසා තම පවුලේ සාමාජිකයන් මිය යාම ගැන අධික වේදනාවෙන් සිටින අය උදෙසා යාච්ඤා කරමු.

**ජූනි : 12-** කිතුණුවන්ට පැමිණෙන පීඩාවලට මුහුණ දී යේසුස්වහන්සේගේ නාමයෙන් ජයග්‍රණය ලැබීම උදෙසා යාච්ඤා කරමු.

**ජූනි : 13-** ජනාධිපතිතුමාට අගමැතිතුමාට දේශය උදෙසා තම වගකීම හරියාකාරව ඉටුකිරීමට ශක්තිය ඉල්ලා යාච්ඤා කරමු.

**ජූනි : 14-** ඔබ සහ ඔබ ආදණීයන්ගේ ආත්මික වර්ධනය උදෙසා යාච්ඤා කරමු.

**ජූනි : 15-** පීඩාවන් තුළින් ගමන් කරන සෑම දේව සේවකයන් සහ දේව සභාවන් උදෙසා යාච්ඤා කරමු.

**ජූනි : 16-** දේව සේවකයන් ශුද්ධාත්මයෙන් පිරී සේවය කරන පිණිස යාච්ඤා කරමු.

**ජූනි : 17-** කිතුණු දේවස්ථාන අවට ජීවත්වන යේසුස්වහන්සේ පිළිනොගත් අයගේ ගැලවීම උදෙසා යාච්ඤා කරමු.

**ජූනි : 18-** අපට වැරදි කළ අයට සමාව දෙමින් ඔවුන්ට ආශිර්වාද කර යාච්ඤා කරමු.

*ආත්මික ගීතිකාවලින් ද, කවි වලින්ද ආත්මික ගී වලින් ද එකිනෙකාට උගන්වමින් දැනමුතුකම් දෙමින් නුඹලාගේ සිත්වල අනුග්‍රහය ඇතිව දෙවියන්වහන්සේට ගීතිකා කරපල්ලා.'' (කොලොස්සි 3:16)*

අප අතරින් කී දෙනෙක් දෙවියන්වහන්සේට අවංකවම ප්‍රශංසා කරනවා ද? අප තුළ එක්සිත්කම තිබීම ඉතාම වැදගත් වෙයි. අපව දකින්නාවූ මනුෂ්‍යයන් අපව දේව දරුවන් ලෙස දැකිය යුතුය. අප හා සමග සිටින්නාවූ අය අපගේ එක්සත්කම තුලින් දෙවියන්වහන්සේගේ ප්‍රේමය දැකිය යුතුය. දේව භය ඇති මනුෂ්‍යයා මෙලෙස ආශිර්වාද ලබයි. එබැවින් උන්වහන්සේ තුලින් අප ගොඩනැගිය යුතුය. ඒ තුලින් අප අන් අයට සේවය කරන්නටත් අන් අයට උදවු උපකාර කිරීමටත් හා ඔවුන්ට ගරු කරමින් අපට අවවාද අනුශාසනා දීමට හැකිවනු ඇත. අද බොහෝ දෙනා ඔවුන්ගේ බලය හා ස්ව කැමැත්ත මත ඔවුන්ගේ ජීවිතය ගොඩනැගෙනු ඇත. එබැවින් ඔවුන්ගේ ජීවිත තුල ඵල දැරීමක් හා වර්ධනය වීමක් දකින්නට නොලැබේ. සුදුසු ලෙස අප ද ගොඩ නැගුනහොත් බොහෝ ප්‍රශ්න කරදර හා පරාජයන් වලට මුහුණ දීමට සිදුවෙනු ඇත.

ප්‍රශ්න කරදර එන විටදී පමණක් දෙවියන්වහන්සේ සෙවීම අනතුරුදායක වෙයි. ඕනෑම අවස්ථාවකදී දෙවියන්වහන්සේට ආදරය කිරීමට අප හුරු පුරුදු විය යුතුය. ඔබ එසේ උන්වහන්සේට ප්‍රේම කරනවානම් දෙවියන්වහන්සේ තුලින් ඔබ ගොඩනගනු ලැබේ. සියල්ලෙන් සඵලවත් මනුෂ්‍යයා දෙවියන්වහන්සේව අමතක කරනු ලබයි. ඔහු දේවස්ථානය වෙත යාමට අමතක කරයි. ඔබගේ සඵලත්වයේදී ඔබ දෙවියන්වහන්සේ සිහි නොකලහොත් ඔබට සියල්ල අහිමි වන විටදී කිසිවෙක් ඔබට උපකාර නොකරනු ඇත. සැම විටම අප සිහියේ තබාගත යුතු දේ නම් දෙවියන්වහන්සේ අපව තෝරා පත් කරගෙන ඇත්තේ අපගේ ඇසට දැකිය නොහැකි වූ මහත් වූ දෙයක් උදෙසා බවයි. මෙය ලෝකයේ පවතින්නාවූ සියල්ලම අස්ථිරය. නමුත් දෙවියන්වහන්සේ කෙරෙන් පැමිණෙන්නාවූ සියල්ල පමණක් සත්‍ය වේ. මේ කාරණය අප අමතක නොකල යුතුයි.

ඔබ ශුද්ධාත්මයාණන් වහන්සේගේ ආලේපයෙන් පූර්ණ වුනාවූ දෙවියන්වහන්සේ ගෘහය වෙයි. එසේ නම් ඔබගේ සේවය කුමක් විය යුතු ද දේව සේවය සඳහා ඔවුන්ගේ ජීවිතය කැප කලාවූ බොහෝ දෙනෙක් එම සේවයට පිටස්තර වූ කාරණාවන් බලාපොරොත්තුවෙන් සිටි නිසා එම සේවයෙන් ඉවත්ව දේව සේවය ද අමතක කර දමා යති. ඔවුන් දෙවියන්වහන්සේව විශ්වාස කරනු ලබන්නේ ඔවුන්ට අවශ්‍යතාවයක් වූ විටදි පමණි. බොහෝ දෙමාපියන් තම දරුවන් ඔවුන්ට කීකරු නැතැයි කියා දුක් වෙති. බොහෝ අවස්ථාවන් වලට මෙම අකීකරු කමට හේතු වන්නේ දෙමාපියන්මය. දේව වචනය තුල හොෂෙයා 4:6 හි මෙසේ පවසා ඇත. එනම් ඔබ දේව වචනය අමතක කලහොත් දෙවියන්වහන්සේ ඔබගේ දරුවන් ද අමතක කරනු බවයි. අද බොහෝ පවුල්වල ඇති ප්‍රශ්නය නම් දෙමාපියන් ඔවුන්ගේ දරුවන්ගේ ළමා කාලය දී ඔවුන්ගේ දෑතින් අල්ලාගෙන දේව ගෘහයට ගෙන යනවා. එමෙන්ම ඔවුන් වැඩි වර්ධනය වූ විටදී ඔවුන් ඔබ සමග දේව ගෘහයට පැමිණෙති. නමුත් මෙවැනි වාතාවරණයක් ඔබගේ පවුල තුල නොමැති විට දී ඔබගේ පවුල් තුල යම් වැරදීමක් ඇත. නුඹලා දෙවියන්වහන්සේගේ දරුවෝය. එබැවින් ඔබගේ දරුවන්ව ද දෙවියන්වහන්සේ මාර්ගය තුළ මග පෙන්වමින් ගෙනයාම අත්‍යාවශය වේ. ඒ තුලින් දෙවියන්වහන්සේගේ ආශිර්වාදය ඔබගේ දරුවන්ගේ කෙරෙහි පැමිණෙනවා ඇත.

**3. දෙවියන්වහන්සේ සමග ගමන් කිරීම**

*''සියළු යහපත් ක්‍රියාවලින් ඵල දරමින් ද දෙවියන්වහන්සේ දැනගැන්මෙහි වර්ධනය වෙමින් ද.'' (කොලොස්සි 1:10)*

ඔබ දෙවියන්වහන්සේ විසින් ප්‍රිය කරන්නාවූ භාජනයක් විය යුතුය. පව්කාරයන්ගේ මාර්ගයේ නොයාමට වග බලා ගත යුතුය. දෙවියන්වහන්සේගේ දැනගැන්මෙන් පූර්ණ විය යුතුය. දෙවියන්වහන්සේට ඔබගේ ජීවිතය කැප කල යුතුය.

අධර්මිෂ්ඨකම් තිබෙන්නාවූ ස්ථාන වෙතම නොහැරිය යුතු අතර ඔබගේ දරුවන් ද එලෙස සිටින පිණිස ඔබ වග බලා ගත යුතුය. එලෙස ඔබ ජීවත් නොවුහොත් දිනකදී දෙවියන්වහන්සේ ඉදිරියේදී ඔබට කඳුළු සැලීමට සිදු වනු ඇත. එබැවින් දෙවියන්වහන්සේ ඔබට තරවටු කරන විටදී ඔබ ඉතා යටහත් කරමින් දෙවියන්වහන්සේ අනුව යා යුතුය. දෙවියන්වහන්සේගේ කැමැත්ත ඔබගේ ජීවිතය තුළ ඉටු කිරීමට හුරු පුරුදු වෙන්න. ගීතාවලිය 1:1 හි මෙය ඉතා පැහැදිලි ලෙස සඳහන් කර ඇත.

***''දුෂ්ටයන්ගේ මන්ත්‍රණය අනුව නොයන්නාවූ, පව්කාරයන්ගේ මාර්ගයෙහි නොසිටින්නාවූ, නින්දා කරන්නන්ගේ ආසනයේ නොහිඳින්නාවූ මනුෂ්‍යයා ආශිර්වාද ලද්දේය.'' යනුවෙනි. ක්‍රිස්තුස්වහන්සේ නොමැති මනුෂ්‍යයන්ගේ වචන වලට ඇහුම්කන් නොදෙන්න.***

7 වෙනි පිටුවට....

*5 වෙනි පිටුවෙන්....*

**4. ඔබගේ ඇදහිල්ලෙහි ස්ථිරව පවතින්න.**

ඔබගේ පසුබිම කෙසේ වුවත් එනම්, එය යහපත් වුවත්, එය අයහපත් වුවත් ඒ සෑම විටකදීම ඇදහිල්ලෙන් ස්ථිරව සිටිය යුතුය. සෑම දෙයක්ම ඉතා හොඳාකාරයෙන් සිදුවන විටදී ඇදහිල්ලෙන් ස්ථිරව සිටීම පහසු වෙයි. සියල්ල නිසි ලෙස සිදුවන විටදී ඇදහිල්ලක් අවශ්‍යය නොමැත. ආබ්‍රහම් ඔහුගේ ජීවිතයේ ඉතා අමාරු කාලයේදී පවා ඇදහිල්ලේ කුළුනක් ලෙස සිට ගත්තේය. වසර 75 දී දෙවියන්වහන්සේ ඔහුට පුත්‍රයෙකු දෙන බවට පොරොන්දු වුවත් එම පොරොන්දුව ඉටු වන තෙක් ඔහුට වයස අවුරුදු 99 ක් වන තුරුම බලා සිටින්නට සිදුවිය. ඔහු කිසිකලකත් මේ ගැන කෙඳිරුවේ නැත. ඔහු තම සම්පූර්ණ ඇදහිල්ල දෙවියන්වහන්සේ මත තැබුවා. දෙවියන්වහන්සේ යමක් පැවසුවානම් ඒ දේ උන්වහන්සේ අනිවාර්යයෙන්ම ඉෂ්ට කරන බව ඔහු විශ්වාස කළා. එලෙසම ඔබත් ඔබගේ කැඳවීම දෙස බලා සිටින විටදී ඇදහිල්ලෙන් ස්ථිරව බලා සිටිය යුතුය.

අද ඔබගේ මිතුරා හෙට ඔබගේ සතුරා විය හැක. එබැවින් ඔබගේ මිතුරන් කෙරෙහිවත් ඔබගේ මුදල් මතවත් ඔබගේ ඇදහිල්ල නොතබන්න. ස්වාමීන්වහන්සේ තුළ පමණක් විශ්වාස කරන්න. ඔබගේ ඇදහිල්ල තැබිය යුතු එකම මාර්ගය එය පමණක්ම වේ.

**5. ඇදහිල්ල වර්ධනය කරගන්න.**

තවත් ඔබ ළදරුවන් නොවේ. ඔබ ඇදහිල්ලෙන් වර්ධනය විය යුතුය. ඔබ ඇදහිල්ලෙන් නොසෙල්වෙන්නාවූ දේ ඉෂ්ඨ කළ යුතුමය. අපට විරුද්දධව පැමිණෙන්නාවූ යක්ෂයාගේ බලයෙන් අපට ජය ගත හැකිය. බයිබලයේ ආබ්‍රහම් නෝවා ඇදිහිල්ලේ පියවරු ගැන කතා කරති. ඔවුන් දිනෙන් දින ඇදහිල්ලෙන් වර්ධනය වූ බැවින් ඇදහිල්ලෙන් උසස් මනුෂ්‍යයන් වූහ.

*''සැබැවක් සැබවක් නුඹලාට කියමි. මා කෙරෙහි අදහන'නා මා කරන ක්‍රියා කරන'නේ'ය. මා පියාණන්වහන්සේ ළඟට යන නිසා මීට වඩා මහත් ක්‍රියාත් ඔහු කරන්නේය.''(යොහාන් 14:12)*

රොටී 5 මාලු දෙකයි රැගෙන පන්දහසක් සෙනග පෝෂණය කිරීමට දෙවියන්වහන්සේ ට හැකි විය. එබැවින් අපට නිසිසේත්ම මුදල් පසු පස යාමට අවශ්‍යතාවයක් නැත. අපගේ සියලුම අවශ්‍යතාවයන් උන්වහන්සේ සපයන සේක. දවසේ අවශ්‍යතාවය එම දවසට සෑහෙන්නේය. (මතෙව් 6:34) ඔබ ඇදහිල්ල තුළ වර්ධනය වන විට ඔබගේ ජීවිතයේ මහත් වූ දේ කල හැකිය.

*'නුඹලා මා තෝරාගත්තා නොව මම නුඹලා තෝරා පත් කළෙමි. එසේ කළේ නුඹලා ගොස් ඵල දරණ පිණිසත් නුඹලාගේ ඵළ පවතින පිණිසත්ය. මාගේ නාමයෙන් පියාණන්වහන්සේගෙන් නුඹලා ඉල්ලන කොයි දෙයක් නුමුත් උන්වහන්සේ නුඹලාට දෙන පිණිසත්ය.''(යොහාන් 15:16)*

කිසි කලෙකත් ඔබ දෙවියන්වහන්සේව තෝරා ගත්තා යැයි නොසිත්නන. නැත, ඔබ දෙවියන්වහන්සේව තෝරා ගත්තේ නැත. නුමුත් දෙවියන්වහන්සේ ඔබව තෝරාගෙන තිබේ. එබැවින් ඇදහිල්ලෙන් ස්ථිරව සිටින්න.

**හුදකලා කරනු ලැබූ ජීවිතයක**

ඉතා දුෂ්කර ගම්මානයක ගෙවිලියයකුගේ දරුවෙකු වූ ඔහු වසර 30ක් යන තුරුම ලී මඩුවක රෑ කියාවක නිරත වූවාය. නැවත වසර 3ක් පුරාවටම ඔහු රටවටා බොහෝ ස්ථානවලට ගොස් මනුෂ්‍යයන්ට කතා කරමින් ඔවුන්ට ඇහුම්කන් දෙමින් ඔහුගේ ජීවිතය ගත කලා. ඔහු කිසි කලකත් පොතක් ලිව්වේවත් වාර්තාවක් තැබුවේවත් පාසලකට ගියේවත් පුද්ගලික කාර්යාලයක්

*8 වෙනි පිටුවට...*


**A Loving Request To Our Dear Brothers & Sisters**

As you all know we are hard-pressed to meet several needs like the salary of the staff, expenses for the purchase of paper and also the travel expenses. Generally we never ask others to meet our financial needs. But we request those who truly love this ministry to send their offerings through **Money Orders, Cheque or Demand Draft, NEFT, Paypal, PhonePe, Gpay** (98410 71858) or through any other methods and support us in this Ministry. When you send your support please give an intimation to us by SMS, WhatsApp or Phone. We are so thankful to those who are supporting us. **The Lord will surely bless you.**

**"... A brother is born for adversity".**
Proverbs 17:17

**- Editor, Echo of His Call**
98410 71858 / 98412 71858
E.mail : sam@echoofhiscall.org

මෙය ඔබගේ සේවයකි. දෙවියන්වහන්සේගේ නාමයේ ගෞරවය පිණිස මෙය කරන්න. බොහෝ කියවන්නන් අපට අවශ්‍යයි. මෙම සඟරාව එවන පිණිස කරුණාකර ඔබ දන්නාවූ 10 දෙනෙකුට ඔවුන්ගේ නම, ලිපිනය, විද්‍යුත් තැපැල් (Email) හෝ දුරකතන අංක මෙහි සඳහන් කර අප වෙත එවන්න. ඒ අයට අමතරව තවත් අය සිටිනවානම් ඒ අයගේ විස්තරද අප වෙතට එවන්න. එවිට සෑම මසකදීම මෙම සඟරාව අපට ඔවුන් වෙත නොමිලයේ එවීමට හැකිය.

1. ____________________

2. ____________________

3. ____________________

4. ____________________

5. ____________________

6. ____________________

7. ____________________

8. ____________________

9. ____________________

10. ____________________


# ECHO OF HIS CALL - Monthly magazines in 16 languages

**Annual Subscription : Rs. 100/-** **Life Subscription : Rs. 2000/-**

The multifarious activities of **Echo of His Call Ministries** is supported by the free-will offerings and donations of the God's Children like you. You may support **Echo of His Call** and its activities as the Lord leads you. We need your help to send forth the Gospel to the unreached people and plant Churches.

If you would like to receive **ECHO OF HIS CALL** magazines regularly, please write to us. Whenever you change your postal or E.mail addresses, please do inform us your old and new addresses.

**Echo of His Call** is available in 16 languages in our websites also. You can read them by going into the site as well as downloading them and get blessed.

Please send your **Land Phone / Mobile Phone Numbers and E.mail addresses** for updation.

Your letters, prayer requests and your financial helps to **ECHO OF HIS CALL** may please be sent to the address below.



Pastor JONATHAN JONAKAN,
No. 13A, RASAVINTHODDAM LANE, TEMPLE ROAD, JAFFNA, SRILANKA
PH : 0094-021-222 9441 CELL : 0094 - 7740 60912
E.mail : pastorjonakan@gmail.com



BANK DETAILS
SRIMURUGATHAS JONAKAN - A/C. No. : 7425 9747
BANK OF CEYLON, JAFFNA BRANCH, SRILANKA



**H.O. : ECHO OF HIS CALL,** 10, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai - 600 005, India
PH: +91-44-2852 8282, Cell: +91-98410 71858, E.mail: sam@echoofhiscall.org Website: www.echoofhiscall.org



# PIT TO PALACE

## පාලු වලකින් මාලිගාවට

## ‘‘...කියවන්නා තේරුම් ගනීවා....’’ *(මතෙව් 24:15)*

**‘‘මළවුන් නැගුටුවාපල්ලා කුෂ්ඨ රෝගීන් පවිත්‍රකරපල්ලා, යක්ෂයන් දුරුකරපල්ලා, නුඹලා නොමිලයේ ලැබුවහුය. නොමිලයේ දීපල්ලා’’ (මතෙව් 10:8)**

මෑතකදී කිතුණු නොවන මාගේ තරුණයෙක් මා හමුවීමට ආවේය. ඔහු පැමිණ ‘‘මගේ මව වයස අවුරුදු 40ක් පමණ වන අතර ඇය බොහෝ රෝගී තත්ත්වයන් වලින් පෙලී සිටින බැවින් ඇයට එයින් සුවය ලබා ගැනීම පිණිස නොයෙකුත් ආගමික වතාවත් කල අතර ඇය බොහෝ වෛද්‍ය උපදෙස් ලබා ගත්ත ද ඒවායින් කිසිදු සුවයක් ලබා ගැනීමට ද නොහැකි විය. මෙතෙක් ඇයට සිදුකල ශෛලය කර්මයන් ද ආසාර්ථ වූ බැවින් වෛද්‍යවරුද ඇයව ප්‍රතික්ෂේප කලේය. එමෙන්ම තව දුරටත් ඇය උදෙසා වියදම් කිරීමට ඔවුන් සතුව මුදල් ද නොමැත. එමෙන්ම එම මවගේ වේදානාව දිනෙන් දිනම වැඩිවන්නට විය.’’ කියා පැවසීය. එමෙන්ම රෝහලට පැමිණ තම මවට යාච්ඤා කරන්න පැමිණෙන්නය කියා එම තරුණයා මා හට පවසනු ලැබීය.

මේ වන විට මා ඉතා කාර්ය බහුලව සිටියත් කුඩා කාලයක් වෙන්කරගෙන රෝහලට යාමට මා තීරණය කර ගතිමි. එනමුත් ඇය දැඩි සත්කාර ඒකකයෙහි සිටි නිසා ඇය ළඟට යාමට මා හට අවසරයක් ද නොතිබුණ නිසා මා දේවස්ථානයේ සිට යාච්ඤා කරමි කියා නැවත පැමිණීමට යනවිටදී ඔවුන්ගේ නෑදෑ හිත මිතුරන් මා හට එතැනින් පිටවීමට ඉඩ දුන්නේ නැත. එම ස්ථානයෙහි සිටම ඇය වෙනුවෙන් යාච්ඤා කරන්නය කියා ඉතා බැගෑපත්ව ඉල්ලා සිටියාය.

අවසානයේදී මා එයට එකඟ වී එම ස්ථානයෙහිම සිට ඔවුන් සියලුදෙනාම එකතු කර මනුෂ්‍යා මෙවැනි ප්‍රශ්න, කරදර තුලින් ගමන් ගමන් කරන විටදී දෙවියන්වහන්සේ ඔවුන් තුළ ක්‍රියාකරනු ලබන්නේ කෙසේදැයි කියා මා පවසමින් ඔවුන්ට ධෛර්‍යයමත් වචන ප්‍රකාශ කෙරුවෙමි. පසුව ඇය උදෙසා ඔවුන් සමග එකතු වී මා යාච්ඤා කළෙමි. අප යාච්ඤා කර අවසන් වී අපගේ ඇස් විවෘත කරන විටදී එම රෝහලේ කාර්‍ය මණ්ඩලයේ දෙදෙනෙකු අප වෙතට පැමිණ මගේ අතට අත දී ‘‘මීට වසර පහළොවකට ප්‍රථමදී ඔබ කළ යාච්ඤාවකින් මගේ දරුවා සුව වූ බව ඔබට මතකද?’’ කියා පැවසූ අතර ‘‘දැන් ඔබ මේ ස්ථානයෙහි එකතු වී සිටින්නේ ඇයි?’’ කියා අසනු ලැබීය.

එවිට මම ඔහුට ‘‘මෙහි දැඩි සත්කාර ඒකකයේ සිටින රෝගී මවක් උදෙසා යාච්ඤා කිරීමට පැමිණියා.’’ කියා පැවසුවෙමි. එවිට ඒ නිලධාරියා කතා කරමින් ‘‘මා මෙම වාට්ටුවේ ප්‍රධාන වෛද්‍යවරයායි. මා දැන් ඇයට අවශ්‍යය සියළු ප්‍රතිකාර කරමින් සියළුම දේ මා ඉටු කරන්නම්.’’ කියා පවසමින් එහි සිටි සියලු දෙනාවද ධෛර්‍යමත් කරමින් ඔවුන්ට යන්නය කියා පවසනු ලැබීය.

මීට දින කිහිපයකට පසුව එම රෝගී මවගේ පවුලේ අය මා හමුවීමට පැමිණ යහපත් ආරංචියක් ගෙන ආවේයි එනම්, ‘‘මාගේ මවට මින් ඉදිරියට කිසිදු ශෛල්‍යකර්මයක් අවශ්‍ය නොමැති අතර ඇයට දැන් සම්පූර්ණයෙන්ම සුවය ලැබී ඇතැයි’’ කියා පවසනු ලැබූ අතර දෙවියන්වහන්සේ අපගේ යාච්ඤාවට පිළිතුරු ලබා දී සියළු දෙනාගේම කරුණාව අපට දී ඇතැයි කියාද පවසනු ලැබීය. එමෙන්ම ඔවුන් දෙවියන්වහන්සේගෙන් ලැබූ සුවය හා යහපත්කම් ගැන ස්තුති කර මෙම ස්ථානයෙන් පිටව ගියේය.

මෙය කියවන්නා වූ ඔබටද දෙවියන්වහන්සේ ඒ ආකාරයෙන්ම ක්‍රියාකර ආශිර්වාද කරනු ඇත. ඔබත් ඔබගේ සියලු මාර්ග උන්වහන්සේට කැපකර අද උන්වහන්සේව පිළිගන්නවානම් උන්වහන්සේ කිසි කලකත් ඔබව අත්නොහැර ඔබව උසුලාගෙන ඔබව සනසන බව උන්වහන්සේ පවසනවා ඇත. ***‘‘නුඹලා අනාථව නාරින්නෙමි.’’ (යොහාන් 14:18)*** දෙවියන්වහන්සේ ඔබට ආශිර්වාද කරන සේක්වා.

**‘‘නුවණැත්තේ මේ දේ සිතට ගනීවා.’’ (ගීතාවලිය 107:43)**

*7 වෙනි පිටුවෙන්....*

තබා ගත්තේවත් ඔහුටම කියා ස්ථිරව නිවසක්වත් තිබුනේ නැත. ඔහු උසස් කරගන්නා පිණිස ඔහුට කිසිවත් තිබුනේ ද නැත. ඔහුව හඳුන්වා දීමට ඔහුටම කියා සහතික පතක් හෝ නොතිබුණ අතර ඔහුට සිටියේ ඔහු පමණකි. ඔහුට වයස අවුරුදි 33 දී සමාජයේ සිටි බොහෝ දෙනා ඔහුට විරුද්ධව සිටි අතර මිතුරන් ද ඔහුව ප්‍රතික්ෂේප කරනු ලැබුවේය.

ඔහු සිරබාරයට ගත් විටදී ඔහු සමග සිට ගනු ලැබුයේ ඉතාම අතලොස්සක් පමණි. ඔහුව හොරුන් සමග එකට දඬුවම් කරන පිණිස රජයේ අනුමැතිය ද දෙන ලදී. ඔහුගේ ශරීරය භූමදානය කරන පිණිස අවසරයක් ගනු ලැබූයේ එක් මිත්‍රයෙකු පමණි. මෙම සිදුවීම මීට ශත වර්ෂ 20 කට ඉහතදී සිදු වුවාවූ දෙයකි. අදටත් මනුෂ්‍යයන් අතර ඉතා උසස් නාමයක් දරන්නාවූ ප්‍රේමයේ එකම සංකේතය ද වන්නේ ඔහු පමණි.

එවකට සිටියාවූ බලවත් රජවරු අතර මුලාදෑනින් හා සෙබළුන් අතර මෙවැනි වු ආදර්ශමත් ජීවිතයක් කිසිවෙක් ගත කලේ නැත. මීට වසර 2000කට ප්‍රථම යේසුස්වහන්සේ ජීවත් වූ කාලයේදී උන්වහන්සේ බොහෝ දෙනාගේ සිත් ස්පර්ෂ කළේය. උන්වහන්සේ පරිසිවරුන්ට හා මුලාදෑණින්ට කතා කරමින් පවසනු ලැබුයේ ප්‍රධානින් හා ධර්මිෂ්ඨයන් යොහාන්ගේ එළිදරව්වට අනුව පසුතැවිලි වී බෞත්ස්මය ලැබූ පසු ඔවුන් දෙවියන්වහන්සේගේ රාජ්‍යයට ඇතුල් වන බවයි. යේසුස්වහන්සේ ඔවුන්ට මෙසේ තේරුම් කර දුන්නේය. එනම් ''ඔබගේ පිටස්තරයෙන් පෙනෙන්වූ වස්ත්‍රය එසේත් නැත්නම් ඔබගේ නිල තල කිසිවක් ස්වර්ග රාජ්‍යයට ඇතුල්වීම අවසර පත්‍රයක් නොවන අතර ස්වර්ග රාජ්‍යයට ඇතුළ්වන්නේ උන්වහන්සේගේ අණ පණත්වලට කීකරු අය පමණි.

එමෙන්ම අදටත් සේවයෙහි නියුතු වන්නාවූ අපත් අප දේවගැතිවරු සියල්ලනුත් කුමන නිලයක් දරුවත් එය ස්වර්ග රාජ්‍යයට යාමට අවසර පත්‍රයක් නොවන අතර මේ පොළොව තුළ දෙවියන්වහන්සේගේ කැමැත්ත කරන්නාවූ අය පමණක් ස්වර්ග රාජ්‍යයට අයිති වෙති.

මෙවැනි දේවල් අද අපගේ සංස්කෘතියට එකතුකර ගනිමින් දෙවියන්වහන්සේ තුලින් සැබෑවූ කිතුණු ජීවිතයක් ගත කරමින් දෙවියන්වහන්සේ තුලින් සැබෑ කිතුණුවෙකු විය හැකිය. ලෞකික ජීවිතයේදී බොහෝ නිලතල හා නාමයන් අපට ලබාගත හැකිය. යේසුස්වහන්සේ කිසි කලෙකින් නිලතල හා උසස්වීම් වලට විරුද්ධ නැත. නමුත් මෙයින් උන්වහන්සේ පැහැදිලි කරනු ලබන්නේ ස්වර්ග රාජ්‍යයට යාමට මෙය සුදුසුකමක් නොවන බවයි. එබැවින් ලෝකයේ රැකියාවන් සඳහා අපගේ දක්ෂතා හා හැකියාවන් වල දත්ත ලැයිස්තුවක් ලබා දුන්නද එම රැකියාවෙහි විවිධ උසස්වීම් ලබා ස්ථිර කිරීමට එම ස්ථානය තුල අපගේ ක්‍රියා කිරීම ප්‍රයෝජනවත් වනු ඇත. එමෙන්ම කිතුණු ජීවිතයේ ද සභාවේ නිලතලයන් දේව ධර්මානකූල දැනුම දරන්නාවූ විවිධ නිලතලයන් යන මේ සියල්ලම යහපත් වුවත් අපගේ ක්‍රියාවන් තුලින් අපගේ ඇදහිල්ල පෙන්නුම් කිරීම ඉතා වැදගත් වේ. (මතෙව් 25) හි යේසුස්වහන්සේ පැවසුවේ මා කෙරෙහි ''ස්වාමිනී, ස්වමිනී'' කියා මොරගැසීම නොව උන්වහන්සේගේ කැමැත්ත කරන අය පමණක් ස්වර්ග රාජ්‍යයට ඇතුලුවන බවයි. එනම් අපට තිබෙන වගකීම නම් කඳු මුදුනේ පර්වතයක් මත තමාගේ නිවස තැනූ පුද්ගලයෙකු ලෙස දේව වචනය තුල අප ස්ථිරව ජීවත් වීමයි. එවිට පැමිණෙන සියලු කුණාටු මැද අපට ස්වාමින්වහන්සේ තුල ස්ථිර ජීවිතයක් ගත කිරීමට හැකිවනු ඇත.

යේසුස්වහන්සේ යහපත් ගුරුවරයෙක් විය. සුභාරංචි පොත්වලින් අපට මේ දේවල් ඉතා පැහැදිලිව දැකගත හැකිය. එබැවින් අපගේ ඇදහිල්ල කොතරම් වැදගත් ද කියා එහි සඳහන්ව ඇත. එබැවින් ක්‍රියාවන් තුල නැති තනතුරු හා නිලතල රහිත වන්නේය.

**Regd. with the Registrar of Newspapers for India**
**under No. TN/SIH/2006/17846**
**Date of Publication: First week of every month**
**Date of Posting : 1st & 2nd of every month**
**Posted at "Egmore RMS / 1 Patrika Channel"**

on 2nd JUNE 2021

**If un-delivered please return to:**
**ECHO OF HIS CALL (SINHALA)**
**P.O. Box No. 2957,**
**Chepauk, Chennai - 600 005, INDIA.**
**Phone: (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766**

***JESUS LOVES YOU!***

To

*GOD BLESS YOU!*

Owned and published by **S. Sam Selva Raj** from Old No.18, New No. 10, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005 and printed by him at **Echo of His Call Printers** Old No. 18, New No. 10, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005. Editor: **S. Sam Selva Raj.**